www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුද්ගලීකරන නියෝග ක්‍රියාත්මක කරයි

## Sri Lankan government imposes IMF privatisation demands

**සමන් ගුනදාස විසිනි**
**2016 අගෝස්තු 13**

පසුගිය සතිය අවසානයේ ශ්‍රී ලන්කන් ගුවන් සේවය A330 ගුවන් යානා තුනක් පකිස්ථාන ජාත්‍යන්තර ගුවන් සේවයට කුලී පදනම යටතේ ලබා දීමේ ගිවිසුමකට එලැඹියේය. ජාතික ගුවන් සේවය පුද්ගලීකරනය කිරීමේ තවත් පියවරක් වන මේ ගනුදෙනුව, විකුනා දැමීම සඳහා රැකියා අඩු කල යුතු බවට හා රාජ්‍ය ආයතන "ප්‍රතිව්‍යුහගත කල යුතු" බවට ජාමූඅ කරන නියෝග සමග ගැලපේ.

හිල්ටන් හෝටලය, ග්‍රෑන්ඩ් හයත් හෝටලය සහ ලංකා හොස්පිටල් ආයතනය ද ඇතුලු රජයට අයත් ආයතන ගනනාවක් විකුනා දැමීම ගැන අගමැති රනිල් වික්‍රමසිංහ විසින් කරන ලද ප්‍රකාශයෙන් අනතුරුව මෙම නව කුලියට දීමේ සූදානම ප්‍රකාශයට පත්විය. ආන්ඩුවේ නය අඩුකර ගැනීම සඳහා මත්තල ගුවන් තොටුපලත් හම්බන්තොට වරායත් ඒවා ඉදිකල චීන සමාගම්වලට විකිනීමට රජය සලකා බලමින් සිටින බව ඔහු පැවසීය.

මෑතකදී පැවැත් වූ ශ්‍රී ලංකා ආර්ථික සමුලුවේදී සංවර්ධන උපායමාර්ග හා අන්තර්ජාතික වෙලඳාම පිලිබඳ ඇමති මලික් සමරවික්‍රම මෙසේ පැවසුවේය: "ඊලඟ මාස කිහිපයේදී, කොටස් වෙලඳපොල හෝ යෝජනා අයැදුම් (RFP) හරහා හෝටල්, ලංකා හොස්පිටල්ස් සහ කොලඹ ව්‍යාපාර කලාපයේ ඇති පුද්ගලික වානිජ දේපල විකුනා දැමීම අපගේ අරමුනයි."

මේ වසරේ සැප්තැම්බර් වන විට ශ්‍රී ලන්කන් ගුවන් සේවය විකුනා අවසන් කිරීමට අවශ්‍ය බව ජාමූඅ පසුගිය මැයි මාසයේ නිකුත් කල වාර්තාවකින් පැවසුවේය. මුදල් අමාත්‍යාංශයට අනුව, ජාතික ගුවන් සේවයේ නය බර රුපියල් බිලියන 62 (එජ ඩො මිලියන 427) කට වැඩිය. ඔවුන් ඒ සඳහා සුදුසු ව්‍යාපාර සහකරුවෙක් සොයමින් සිටී.

ගිය පෙබරවාරියේදී ගුවන් සේවය, කොලඹ හා රෝමය අතර තම ගුවන් ගමන් නවතා දැමූ අතර ඔක්තෝබර් වන විට කොලඹ හා ෆ්‍රැන්ක්ෆර්ට් සහ කොලඹ හා පැරිස් ගුවන් ගමන් වලින් ඉවත් වීමට සැලසුම් කරමින් සිටී.

බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල මගින් දැනට පවත්වා ගෙන යනු ලබන අභ්‍යන්තර හා බාහිර සේවා පුද්ගලීකරනය කරන බව ජූනි 28 දා ශ්‍රී ලන්කන් ගුවන් සේවාවේ සභාපති අජිත් ඩයස් සේවකයන්ට පැවසීය. එම සේවාවන් සැපයීම ගුවන් සේවයට ලාභදායී බව පෙන්වා දෙමින් එලෙසම ආහාර පාන සැපයීම හා ඉංජිනේරු අංශ ද පුද්ගලික සමාගම් වලට විකුනා දමනු ඇතැයි අනතුරු අඟවමින් ගුවන් සේවකයෝ උද්ඝෝෂනය කලහ. රාජ්‍ය ගුවන් සේවාව "මන්දගාමී නමුත් ස්වාභාවික මරනයක්" කරා බලහත්කාරයෙන් ඇදගෙන යමින් සිටින බව සේවක නියෝජිතයෙක් පැවසීය.

ශ්‍රී ලන්කන් ගුවන් සේවාව පුද්ගලීකරනය කිරීම, අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්ට අත්විය හැකි ඉරනම ගැන ඉඟියක් සපයයි. රජය සතු ආයතන ආර්ථිකය මත ඇති ප්‍රධානම නය බරක් ලෙසත් පුද්ගලික ආයෝජකයන් සඳහා ලාභ ලැබිය හැකි විභවයන් සහිත මූලාශ්‍ර බවත් ජාමූඅ සලකයි.

එහි මැයි මාසයේ වාර්තාව මෙසේ ප්‍රකාශ කලේය. "2010 දී ජාතික ආර්ථික ක්‍රියාවලියේ සියයට 17 ක් නියෝජනය කරමින් ශ්‍රී ලංකාව සතුව ආයතන 235 ක් පැවතියේය. සමහර රාජ්‍ය ආයතන ලාභ ලබන හා හොඳින් පවත්වා ගෙන යන ව්‍යවසායන් වුව ද සමස්තයක් ලෙස ඒවා පුද්ගලික ආර්ථිකයට බාධා කරන අතර රජයේ මුදල් ගිල දමයි. (විශාලතම රාජ්‍ය ආයතනවලට සෘජුව හා රාජ්‍ය බැංකු හරහා යන දෙවිදිහටම අරමුදල් සැපයෙන්නේ ය.)"

ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ලංකා විදුලිබල මංඩලය (ලංවිම), ශ්‍රී ලන්කන් ගුවන් සේවය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මංඩලය, ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම, සහ ශ්‍රී ලංකා වරාය අධිකාරය, ජාමූඅ විසින් හඳුනා ගැනුන විශාලතම රාජ්‍ය ආයතන වන අතර ඒවායේ ප්‍රධාන "ප්‍රතිව්‍යුහගත කිරීම්" සිදුකරන ලෙස නියෝග කර තිබේ.

"තම මෙහෙවර, ඉහල මට්ටමේ අරමුනු, හා බහු-වාර්ෂික ආයතනික සැලසුම; ප්‍රාග්ධන වියදම හා මූල්‍ය සැලසුම්; නිශ්චිත මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක; හා වානිජමය නොවන බැඳීම් ගැන විස්තර හා පිරිවැය" පිලිබඳ සංක්ෂිප්ත වූ "ආයතනික අභිප්‍රාය ගැන ප්‍රකාශනයක්" නිකුත්කරන ලෙස ජාමූඅ ආන්ඩුවට හා මෙම රාජ්‍ය ආයතනවලින් ඉල්ලීමක් කලේය.

"නිසැක බල ශක්ති සභානාධාර - සිල්ලර ඛනිජ තෙල් හා විදුලි බිල් මිල ගනන් පිරිවැය ප්‍රතිසාධන මට්ටම්වලට පහලින් පවත්වාගෙන යාම" නිසා ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා ලංවිම පාඩු ලබන බව ප්‍රකාශ කරන ජාමූඅ, දෙසැම්බර් වන විට ආන්ඩුව මෙම ගාස්තු සහ ජල බිල් ඉහල දැමිය යුතු බව ඇඟවුම් කලේය.

"ලංකා ඛනිජතෙල් සංස්ථාවේ අනාගත පාඩු වැලැක්වීමටත් විශාල සිල්ලර ගැලපීම් මගහරවා ගැනීමටත්, පෙට්රෝලියම් නිෂ්පාදන සඳහා සූත්‍ර මත පදනම් වන ස්වයංක්‍රීය මිල යාන්ත්‍රනයක් බලධාරීන් විසින් හඳුන්වා දෙනු ඇත. එසේම, පිරිවැය-පරාවර්තික ආකෘතියකින් විදුලි හා ජල ගාස්තු නියම කරන්නට රාජ්‍ය උපයෝගිතා කොමිසමට වැඩි බලතල දෙනු ලැබේ." ජාමූඅ පැවසීය.

ලංවිම "පිරිවැය-පරාවර්තික මූල්‍ය ප්‍රතිපත්තියක් කරා යමින් පවතින" බවත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහාන මංඩලය "ආදායම් නොමැති ජලය අඩුකිරීමට" ඉක්මනින් පියවර ගත් බවත් ප්‍රකාශ කරමින්, සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව මෙම මගපෙන්වීම් මුදල් අමාත්‍යාංශයේ අර්ධ වාර්ෂික වාර්තාවේ අඩංගු කර තිබේ.

"රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ගිවිසුම්ගත කිරීම සඳහා ප්‍රතිපත්ති, නීති හා ආයතනික බැඳීම් පැහැදිලිව සැලසුම් කිරීමට" රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර සැකිල්ලක් රජය ස්ථාපිත කරමින් සිටින බව මෑතක දී පැවති ශ්‍රී ලංකා ආර්ථික සමුලුව අමතමින් සංවර්ධන උපායමාර්ග හා අන්තර්ජාතික වෙලඳාම් ඇමති මලික් සමරවික්‍රම පැවසීය.

රාජ්‍ය ආයතනවල "කාර්යක්ෂම පාලනය" ඉලක්ක කරමින් රාජ්‍ය ආයතන සංවර්ධන පනත ඊලඟ මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව ඔහු පැවසීය. මෙහි තේරුම, දැනටමත් ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ක්‍රියාත්මක කරනු ලබන ආකාරයේ රැකියා කපන, රැකියාවෙන් නෙරපා හැරීම් හා වැඩකරන කොන්දේසි වලට පහර දීමයි.

රැකියා වනසන "ස්වේච්චා විශ්‍රාම යෝජනාක්‍රමයක්" දැනටමත් ශ්‍රී ලංකා ගමනාගමන මංඩලයට හඳුන්වා දී තිබේ. රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයකට පරිවර්තනය කිරීමට ඇවැසි කොන්දේසි සැකැසීමට ධීවර සංස්ථාවේ රැකියා 415 ක් එනම් දැනට ඇති 1,100 ක සේවක සංඛ්‍යාවෙන් අඩක් දොට්ට දැමිය යුතු බව ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය මහින්ද අමරවීර නිවේදනය කලේය.

වානිජකරනය හා පුද්ගලීකරනය සඳහා වන මෙම පියවරයන්ට කම්කරු පන්තියෙන් දැඩි විරෝධයක් එල්ල වන බව සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව හොඳින්ම දනී. කොලඹ ආන්ඩුව එල්ටීටීඊයට එරෙහිව පැවති 30 අවුරුදු සිවිල් යුද්ධය තුලදී ගොඩ නගා ගත් පොලිස් රාජ්‍ය යාන්ත්‍රනය මුවහත් කරමින් සිටින්නේ එබැවිනි.

ජාතික ආරක්ෂාව හා සංවිධිත අපරාධ සම්බන්ධව නව නීති මාලාවක් ආන්ඩුව විසින් සම්පාදනය කරනු ලැබ ඇති අතර වැඩ වර්ජන, කම්කරු විරෝධතා සහ පෙලපාලි ඇතුලු සියලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මැඩලීමට ඒවා භාවිතා කරනු ඇත. විශ්ව විද්‍යාල සිසුන්ගේ අරගලයන්ට එරෙහිව යොදන ලද පොලිස් මර්දනයෙන් හා මෑතක විශ්ව විද්‍යාල අනධ්‍යයන සේවකයන්ගේ වැඩ වර්ජනය කඩාකප්පල් කිරීමෙන් පෙන්නුම් කෙරෙන්නේ මෙම නව වැඩ පිලිවෙල යොදා ගන්නා ආකාරයයි.

© www.wsws.org